# ඩිජිටල් ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරය අවම කිරීම

## ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත සහ සාධාරණ ඩිජිටල් ප්‍රවේශයක් සඳහා වන ප්‍රතිපත්තිමය නිර්දේශ



මෙම ප්‍රකාශනය සඳහා අරමුදල් සපයන ලද්දේ යුරෝපා සංගමය විසිනි. එහි අන්තර්ගතය ක්‍රිසලිස් සහ නීතිය හා සමාජ භාරයේ තනි වගකීමක් වන අතර, එය යුරෝපා සංගමයේ අදහස් පිළිබිඹු කිරීමක් නොවිය හැක.

Funded by the European Union

Implemented by: Chrysalis Catalyzing change, LAW & SOCIETY TRUST

## විධායක සාරාංශය

උතුරු පළාතේ කාන්තාවන්, ගැහැණු ළමයින් සහ ලිංගික සුළුතර කණ්ඩායම් ඩිජිටල් අවකාශය තුළ අර්ථවත් ලෙස සම්බන්ධ වීමට බාධා පමුණුවන ව්‍යුහාත්මක සහ සමාජීය බාධක රැසකට මුහුණ දෙති. මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය, ක්‍රිසලිස් ආයතනය, නීතිය හා සමාජ භාරයේ හවුල්කාරිත්වය සහිතව ක්‍රියාත්මක කරන ලද BRIDGE ව්‍යාපෘතිය යටතේ යාපනය, මන්නාරම, වවුනියාව, කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල පැවැත්වූ අවධානය යොමු කළ කණ්ඩායම් සාකච්ඡා හතක සාක්ෂි මත පදනම් වේ.

දුර්වල ඩිජිටල් යටිතල පහසුකම්, සීමාකාරී නීති, පීතෘමූලික සමාජ සම්මතයන්, අඩු ඩිජිටල් සාක්ෂරතාව, සයිබර් ආරක්ෂණ අවදානම් සහ අන්තර්ජාලය පදනම් කරගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය (OGBV) මෙහිදී හඳුනාගත් ප්‍රධාන බාධක වේ. මෙම අභියෝග කෙරෙහි අදාළ කලාපයේ පශ්චාත් යුද සන්දර්භය මෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, ආගම සහ පන්තිය මත පදනම් වූ අසමානතා සෘජුවම බලපායි.

උතුරු පළාත තුළ වඩාත් ආරක්ෂිත, සාධාරණ සහ අන්තර්කරණය වූ ඩිජිටල් ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ඉලක්කගත, ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති නිර්දේශ හරහා යෝජනා කෙරේ.

## ක්‍රමවේදය

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය 2024 අප්‍රේල් 16 සිට 19 දක්වා පවත්වන ලද ප්‍රාථමික ගුණාත්මක පර්යේෂණ මත පදනම් වේ. උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහකදී සාමාජිකයන් 8 දෙනෙකුගේ සිට 10 දෙනෙකු දක්වා වූ කණ්ඩායම් 7ක් සමඟ සාකච්ඡා පැවැත්විණි. මීට මාධ්‍යවේදීන්, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ නියෝජිතයෝ සහභාගී වූහ. සාකච්ඡාව ප්‍රධාන තේමා හයක් ඔස්සේ මෙහෙයවන ලදී. එනම් සහභාගීත්වය සහ සම්බන්ධතාවය, නියෝජනය සහ අනන්‍යතාවය, සමාජ සම්මතයන් සහ අන්තර්ජාල සංස්කෘතිය, අන්තර් ඡේදනය වන ගැටලු, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය, මෙන්ම තාක්ෂණික වේදිකා සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති වේ.

ද්විතීයික සාක්ෂි ලෙස GSMA (2024), UN Women(2022), UNICEF සහ ITU (2019) වාර්තා භාවිත කර ඇත. එසේම ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත(PTA), 2007 පරිගණක අපරාධ පනත සහ 2007 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනත යන නීතිමය රාමු ද මෙහිදී සලකා බලා ඇත.

## පසුබිම සහ සන්දර්භය

ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනය 1980 දශකයේ ආරම්භ වූ අතර, 1990 දශකයේ මැද භාගයේදී විදුලි සංදේශ ලිහිල්කරණයත් සමඟ එය වේගවත් වී සැලකිය යුතු දියුණුවක් අත්කර ගත්තේය (Gunawardene, 2017). 2025 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ පුද්ගලයින් මිලියන 13.9 ක් අන්තර්ජාලය භාවිතා කළ අතර, එම කාලය වන විට අන්තර්ජාල විනිවිද යාම (online penetration) සියයට 59.7 ක් විය (DataReportal, 2026) කෙසේ වෙතත්, මෙම ප්‍රතිලාභ අසමාන ලෙස බෙදී ගොස් ඇති අතර, විශේෂයෙන්ම වසර 30 ක සිවිල් යුද්ධයක අභියෝග යන්ට තවමත් මුහුණ දෙන උතුරු පළාත මෙහිදී කැපී පෙනේ. දුර්වල යටිතල පහසුකම්, මිලිටරි පැවැත්ම, දෙමළ ප්‍රජාවන් වාර්ගික වශයෙන් කොන් කිරීම සහ මුල් බැසගත් පීතෘමූලික සම්ප්‍රදායන් වැනි ගැටලු මීට ඇතුළත් වේ.

ගෝලීය ඩිජිටල් අවකාශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය, විශේෂයෙන් ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල තවමත් සැලකිය යුතු මට්ටමක පවතී. GSMA (2024) වාර්තා කරන පරිදි, 2022 වන විට අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල (LMICs) ජංගම අන්තර්ජාල භාවිතය සම්බන්ධයෙන් 19% ක ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරයක් පවතින අතර, පිරිමින්ට සාපේක්ෂව අන්තර්ජාලය භාවිතා කරන කාන්තාවන් සංඛ්‍යාව මිලියන 310 කින් අඩු මට්ටමක පවතී. දකුණු ආසියාවේ, ජංගම දුරකථන හිමිකාරිත්වය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය 23% කි (GSMA, 2020). අඩු ආදායම්ලාභී වීම සහ ග්‍රාමීය පදිංචිය වැනි එකිනෙක හා බැඳුණු අවදානම් සහගත තත්ත්වයන් හේතුවෙන් කාන්තාවෝ මෙහිදී විශේෂ බාධාවලට මුහුණ දෙති.

එපමණක් නොව, උතුරු පළාතේ ඩිජිටල් සේවා සහ යටිතල පහසුකම් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත (gender-disaggregated data) නොමැතිකම, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සංකීර්ණ කරයි. මෙම සංක්ෂිප්ත වාර්තාවේ අරමුණ වන්නේ, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් ලබාගත් අවබෝධය, ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්තිමය නිර්දේශ බවට පත් කිරීම මගින් එම අඩුව පිරවීමයි.

## ප්‍රධාන සොයාගැනීම්

| බාධක ක්ෂේත්‍රය | ප්‍රධාන සොයාගැනීම් | වඩාත්ම බලපෑමට ලක්වන කණ්ඩායම් | බලපෑම් මට්ටම |
|---|---|---|---|
| **යටිතල පහසුකම් සහ ප්‍රවේශයේ අසමානතාව** | නාගරික-ග්‍රාමීය සම්බන්ධතා පරතරය, දුර්වල සංඥා පරාස සහ උපාංගවල අධික පිරිවැය. උපාංග හවුලේ භාවිත කිරීම නිසා පෞද්ගලිකත්වය අහිමි වීම | ග්‍රාමීය කාන්තාවන්, අඩු ආදායම්ලාභී පවුල් | තීරණාත්මකයි |
| **සංස්කෘතික සම්මතයන් සහ ස්වයං-වාරණය** | පීතෘමූලික නීති සහ ආගමික පරීක්ෂාවන් නිසා කාන්තාවන්ගේ ඩිජිටල් සහභාගීත්වය සීමා වීම සහ ස්වයං-වාරණයට පෙළඹීම | කාන්තාවන්, මුස්ලිම් කාන්තාවන්, LGBTQIA+ පුද්ගලයින් | තීරණාත්මකයි |
| **සීමාකාරී නීති සහ නිරීක්ෂණය** | ඩිජිටල් නීති සහ රාජ්‍ය නිරීක්ෂණ යාන්ත්‍රණ නිසා මාධ්‍යවේදීන් සහ ක්‍රියාකාරීන් තුළ භීතියක් ඇතිවීම සහ ප්‍රකාශනයේ නිදහස සීමා වීම | මාධ්‍යවේදීන්, ක්‍රියාකාරීන්, දෙමළ ප්‍රජාවන් | තීරණාත්මකයි |
| **සයිබර් ආරක්ෂාව සහ OGBV** | ආරක්ෂාව පිළිබඳ අඩු දැනුවත්භාවය නිසා වංචා, හිරිහැර සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම. කෘත්‍රිම බුද්ධිය මගින් සිදුවන අපයෝජන අලුත් තර්ජනයක් වීම | කාන්තා ක්‍රියාකාරීන්, සංක්‍රාන්ති ලිංගිකයන්, දේශපාලනඥවරියන් | ඉහළයි |
| **ඩිජිටල් සාක්ෂරතාව සහ ප්‍රවේශය** | පෞද්ගලිකත්වය, ආරක්ෂාව සහ තාක්ෂණික මෙවලම් පිළිබඳ අඩු දැනුම සහ භාෂාමය බාධක නිසා ඩිජිටල් ලෝකයෙන් කොන් වීම | ග්‍රාමීය කාන්තාවන්, වයස්ගත කාන්තාවන්, ඉංග්‍රීසි නොවන භාෂා කතා කරන්නන් | ඉහළයි |

## ප්‍රතිපත්ති පරතරයන් විශ්ලේෂණය

| ප්‍රතිපත්ති ක්ෂේත්‍රය | පවතින රාමුව | ක්‍රියාත්මක කිරීමේ පරතරය |
|---|---|---|
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සංවේදී ඩිජිටල් පාලනය** | ජාතික ඩිජිටල් ප්‍රතිපත්තිය GovTech ශ්‍රී ලංකා | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කළ දත්ත නොමැතිකම මෙන්ම ප්‍රතිපත්ති සම්පාදනයේදී කාන්තා නියෝජනයක් නොමැති වීම |
| **සයිබර් ආරක්ෂණ නීති** | පරිගණක අපරාධ පනත / මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත | අසීමිත නීතිමය මැදිහත්වීම් මගින් නිදහස් ප්‍රකාශනය අපරාධයක් ලෙස හැඳින්වීම සහ සුළුතර කණ්ඩායම්වලට අහිතකර ලෙස බලපෑම |
| **කාන්තා / LGBTQIA+ මාර්ගගත ආරක්ෂාව** | ICCPR පනත<br>දණ්ඩ නීති සංග්‍රහය | සිංහල සහ දෙමළ භාෂාවලින් පැමිණිලි කිරීමේ සහ විසඳුම් ලබාගැනීමේ යාන්ත්‍රණවල දුර්වලතාව |
| **ඩිජිටල් යටිතල පහසුකම් සමානතාව** | e-Sri Lanka / නැණසල - අරිවගම් (තොරතුරු මධ්‍යස්ථාන) | උතුරු පළාතේ මෙම මධ්‍යස්ථාන හිඟ වීම සහ ග්‍රාමීය සම්බන්ධතා සඳහා ආයෝජන මදි වීම |

| | | |
|---|---|---|
| **ඩිජිටල් සාක්ෂරතාව සහ අධ්‍යාපනය** | පාසල් විෂය මාලාව | විෂය මාලාවේ සයිබර් ආරක්ෂාව නොමැතිකම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදී වැඩසටහන් නොමැතිකම |
| **ප්‍රතිපත්ති සැලසුම්කරණයේ නියෝජනය** | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | ප්‍රතිපත්ති සම්පාදනයේදී කාන්තාවන්ගේ හෝ උතුරු පළාතේ හඬ නියෝජනය නොවීම |
| **අන්තර්ජාලය හරහා ප්‍රකාශන නිදහස** | 2016 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත / සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ අන්තර්ජාල ආරක්ෂණ පනත මඟින් නිදහස් මත ප්‍රකාශනය අඩපණ කිරීමේ බලපෑමක් ඇති කරයි සහ දෙමළ ජනතාවගේ සැමරුම් මර්දනය කිරීම තවමත් ක්‍රියාත්මක වේ |

## නිර්දේශ

- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කරගත් ඩිජිටල් ප්‍රතිපත්ති සහ පාලනය ශක්තිමත් කිරීම**

  සාක්ෂි මත පදනම් වූ ඩිජිටල් ප්‍රතිපත්ති සම්පාදනය ශක්තිමත් කිරීම සඳහාත්, විශේෂයෙන්ම උතුරු පළාත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කාන්තාවන්, ජනවාර්ගික සුළුතරයන් සහ නොසළකා හරින ලද කණ්ඩායම්වල නියෝජනය සහතික කිරීම සඳහාත්, ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික දත්ත හුවමාරු (National Data Exchange - NDX) රාමුවට ස්ත්‍රී-පුරුෂ භාවය අනුව වෙන් කරන ලද සහ අන්තර්කරණය (inclusion) කෙරෙහි අවධානය යොමු කළ දත්ත ප්‍රමිතීන් ඒකාබද්ධ කිරීම.

- **සාධාරණ ඩිජිටල් යටිතල පහසුකම් සහ ප්‍රවේශය පුළුල් කිරීම**

  අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා උපාංග සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරම මන්නාරම, කිලිනොච්චිය සහ මුලතිව් වැනි පහසුකම් අවම දිස්ත්‍රික්කවල දැරිය හැකි මිලකට සන්නිවේදන පහසුකම්, වැඩිදියුණු කළ බ්‍රෝඩ්බෑන්ඩ් යටිතල පහසුකම් සහ ආරක්ෂිත ප්‍රජා ඩිජිටල් ප්‍රවේශ මධ්‍යස්ථාන ඇති කිරීමට ප්‍රමුඛතාවය ලබා දීම.

- **ඩිජිටල් සාක්ෂරතාවය සහ ප්‍රජා ආරක්ෂණ යාන්ත්‍රණයන් ඉහළ නැංවීම**

  සයිබර් ආරක්ෂණය, පෞද්ගලිකත්වය, අන්තර්ජාලය හරහා සිදුවන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (OGBV) සහ ආරක්ෂිතව පැමිණිලි කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව අවධානය යොමු කරමින්, ග්‍රාමීය කාන්තාවන්, මාධ්‍යවේදීන් සහ LGBTQIA+ ප්‍රජාවන්ට ප්‍රමුඛතාවය දෙමින් ඵලදායී සහ සර්වග්‍රාහී ප්‍රජා පාදක ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් පුළුල් කිරීම.

- **දිගුකාලීන පර්යේෂණ සහ උපදේශන සහය සඳහා ආයෝජනය කිරීම**

  ඩිජිටල් බැහැර කිරීම් (Digital exclusion), අන්තර්ජාලය පදනම් කරගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය (OGBV) සහ අන්තර්ගතයන් වාරණය කිරීම/යටපත් කිරීම වැනි කරුණු පිළිබඳව අඛණ්ඩව පර්යේෂණ කිරීම, ලේඛනගත කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම (Advocacy) සඳහා අවශ්‍ය සහය ලබා දිය යුතුය. එමෙන්ම, ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ සංකල්පය, පුළුල් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව, සිවිල් මැදිහත්වීම් සහ පශ්චාත් යුද ප්‍රතිසංස්කරණ වැඩසටහන්වල අත්‍යවශ්‍ය කොටසක් ලෙස ඒකාබද්ධ කළ යුතුය.

## ආශ්‍රිත මූලාශ්‍ර


- GSMA (2020). The Mobile Gender Gap Report 2020. London: GSMA.
- GSMA (2024). The Mobile Gender Gap Report 2024 (7th ed.). London: GSMA.
- Nalaka Gunawardene (2017). Digital Transformation in Sri Lanka: Opportunities and Challenges in Pursuit of Liberal Policies. Colombo: Friedrich Naumann Foundation for Freedom.
- DataReportal. (2025, November 8). Digital 2026: Sri Lanka. DataReportal. https://datareportal.com/reports/digital-2024-sri-lanka
- Hashtag Generation (2022). Gender and Dissent Report. Colombo: Hashtag Generation.
- International Telecommunication Union (2019). Measuring Digital Development: Facts and Figures 2019. Geneva: ITU.
- Rie Kuroda (2019). Policy Brief: The Digital Gender Gap. Tokyo: W20 Japan.
- Law and Society Trust (2024). Northern FGD Report with LST Key Gaps [Internal project document]. BRIDGE Project. Colombo: Law and Society Trust.
- Law and Society Trust (2024). Identified Gaps [Internal project document]. BRIDGE Project. Colombo: Law and Society Trust.
- Ananya Tyers-Chowdhury & Gina Binder (2021). What We Know About the Gender Digital Divide for Girls: A Literature Review. New York: UNICEF.
- UN Women (2022). Gendered Nature of Digital Inequality: Evidence for Policy Considerations. New York: UN Women.
- Citra Social Innovation Lab. (n.d.). Developing Sri Lanka's national data exchange (NDX). https://www.citralab.lk/work/developing-sri-lankas-national-data-exchange-ndx